# ස්වේච්ඡා සහාය

සුවකල නොහැකි රෝගියකු හට සත්කාර කිරීම කායිකව මෙන්ම මානසිකවද දැඩි වෙහෙසෙකර කාර්‍යයකි. අපගේ පුහුණු ස්වේච්ඡා සේවකයන් විසින් රැක බලා ගන්නන් හට, ප්‍රායෝගික උපකාර සහ මානසික සහාය ලබා දීම මගින් සහනය සැලසිය හැක.

# ඔබ හට විශේෂිත සංස්කෘතික/භාෂා අවශ්‍යතා ඇති නම් කුමක් සිදුවේද?

ඔබගේ සංස්කෘතියට සහ භාෂාවට සංවේදී වීමට ඔබ හට සත්කාර කරන කණ්ඩායම උත්සාහ කරනු ඇත. ඔබගේ ආහාර, ආධ්‍යාත්මික අවශ්‍යතා හෝ ඔබව වෙනත් ලිංගයක අයකු විසින් රැක බලා ගත යුතුද යන්න ආදී විශේෂ සංස්කෘතික අවශ්‍යතා ඇතිනම් අප හට දන්වන්න. ඔබ හට පරිවර්තකයකු අවශ්‍ය නම් කරුණාකර අප හට දන්වන්න. පරිවර්තන සේවා නොමිලේ වන අතර රහසිගතය.

**Health Care Interpreter Service**
(සෞඛ්‍යය සත්කාර පරිවර්තන සේවය)
නොමිලේ සහ රහසිගත පරිවර්තන සේවාව පැය 24 පුරා, සතියකට දින හතක් ලබා ගත හැක.
ඔබට පරිවර්තකයකු ලබා ගැනීමට කාර්‍යය මණ්ඩලය සමග කථා කරන්න.ංළුළංණ පරිවර්තකයන්ද ලබා ගත හැක.
(02) 9840 3456

# උපකාර හෝ තොරතුරු සඳහා හමුවිය යුතු අය

- ඔබගේ සාමාන්‍යය වෛද්‍යවරයා
- ඔබට ප්‍රතිකාර කරන විශේෂඥවරයා
- ඔබගේ පළාතේ රෝහල
- ඔබගේ රෝගය සුවපහසු කරන සත්කාර සේවය

ඔබගේ විමසීම් සඳහා කරුණාකර පහත අංක අමතන්නඃ

ඔබ පෙන්රිත් හෝ බ්ලු මව්න්ටන් පළාත්වල වාසය කරයි නම් පෙ.ව. 9 සිට ප.ව. 4.30 දක්වා

**1800 013 101**

හෝ

ඔබ හෝක්ස්බරි පළාතේ වාසය කරයි නම් පෙ.ව. 9 සිට ප.ව. 12.30 දක්වා හෝ ප.ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

**(02) 4560 5714**

*The production of this pamphlet has been supported by a grant from NSW Health.*

*The design concept of this pamphlet is courtesy of the Palliative Care Council of South Australia, Palliative Care Victoria and Palliative Care Australia.*

WAHS 307

March 2004

SINHALESE

PALLIATIVE CARE SERVICES

රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාර

# සහනය පහසුව උපකාරය

*මරණාසන්න රෝගයකින් පෙළෙන සහෘදයකු හට සත්කාර කිරීම*




Wentworth Area Health Service

Sinhalese.qxd 5/11/2004 2:53 PM Page 2

# රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාර යනු කුමක්ද?

රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාර යනු, සුවකල නොහැකි රෝගයකින් පෙළෙන පුද්ගලයන් හට උපකාර කිරීමයි.

රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාරවල අරමුණ වන්නේ සෑම පුද්ගලයකු හටම, ජීවිතයේ හැකි ඉහලම ගුණාත්මකභාවය ලබා දීමයි. අප විසින් මෙය සිදු කරන්නේ රෝගියා මෙන්ම රැක බලා ගන්නා අයගේ අවශ්‍යතාවයන් අනුව සේවා රැසක් පිළියෙල කර සම්පාදනය කර දීම මගිනි.

කායික, මානසික, සාමාජයීය සහ ආධ්‍යාත්මික ඇතුළු පුළුල් පරාසයක සේවාවන් රැසක් සැපයිය හැක.

## ස්ථානය

රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාර සැපයීම, රෝගියාට අවශ්‍ය ඕනෑම ස්ථානයක සිදු කල හැක. එය :

- රෝගියාගේම නිවසේ
- රැක බලා ගන්නා අයගේ නිවසේ
- Nepean, Hawkesbury, Blue Mountains හෝ Springwood රෝහල්, ඕනෑම සාත්තු නිවාසයක හෝ නේවාසිකාගාරයක.

ප්‍රධාන රැක බලා ගන්නන් වන්නේ පවුලේ අය, ඥාතීන් සහ මිතුරන්ය. ඔබගේ පවුලේ වෛද්‍යවරයා සහ ඔබව සුවපහසු කිරීම සඳහා සිටින කණ්ඩායම විසින් වෘත්තීය උපකාර ලබා දිය හැක.

# රෝගියකු සුවපහසු කිරීම සඳහා කරන සත්කාර යනු කණ්ඩායම් ප්‍රයත්නයකි.

- රෝගියා, එම පුද්ගලයාගේ පවුල සහ රැක බලා ගන්නා අය
- හෙද/හෙදිය
- ස්වේච්ඡා සේවක
- නේවාසික උපකාර සේවක
- දේවගැති/ආගමික හෝ ආධ්‍යාත්මික නායක
- සහෘදයන් වියෝවීමෙන් වැලපෙන්නන් හට උපදෙස් දෙන්නන්
- සමාජ සේවකයන්, භෞත චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයන්, ඖෂධවේදීන් ඇතුළු වෙනත් සෞඛ්‍යය සේවකයන්
- සාමාන්‍ය වෛද්‍යවරුන්
- රෝගියකු සුවපහසු කිරීම සඳහා සත්කාර කරන විශේෂඥ වෛද්‍යවරුන්
- වෙනත් ප්‍රතිකාර කරන විශේෂඥ වෛද්‍යවරුන්

# මා වේදනාවෙන් සිටීනම්, එය සමනය කල හැකිද?

බොහෝ අවස්ථාවල, විකිරණ ප්‍රතිකර්ම, උපදේශ ලබා දීම, නිස්කලංකව සිටීම, භාවනානුයෝගීව සිටීම වැනි ඔබට සරිලන වෙනත් ක්‍රම අඩංගු ඖෂධ හෝ වෙනත් ප්‍රතිකර්ම මාලාවක් උපයෝගී කරගෙන ඔබගේ වේදනාව අඩු කිරීම හෝ සම්පූර්ණයෙන්ම දුරු කිරීම කල හැක.

වේදනා පාලනය සම්බන්ධයෙන් නූතන වර්ධනයන් බොහෝමයක් ඇති අතර ඒවා අතර විවිධ ඖෂධ වර්ග සහ ඒවා ලබා දෙන ආකාරය ඇතුලත්වේ. මෙම විෂය සම්බන්ධයෙන් ඔබගේ සාමාන්‍ය වෛද්‍යවරයා සහ රෝගියකු සුවපහසු කිරීමේ සත්කාර සේවය මගින් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

# මාගේ අවසන් දින තෙක්ම නිවසේ සිටිය හැකිද?

ඔබ සුවපහසු කිරීමේ සත්කාර සේවය විසින් ඔබ සහ ඔබව රැක බලා ගන්නා අය හට සිටීමට අවශ්‍ය ඕනෑම ස්ථානයක සිටීමට උපකාර කරනු ඇත. බොහෝ විට මෙය ඔබගේම නිවසයි.

සමහර අවස්ථාවල, අධික සත්කාර ලබා දීම මගින් රැක බලා ගන්නා අයව අධික වෙහෙසට පත් විය හැක. මෙවැනි අවස්ථාවක, Penrith, Blue Mountains හෝ Hawkesbury වැනි ප්‍රදේශ තුල ඇති රෝහලකට රෝගියාට ඇතුළු විය හැක. මේ ආකාරයට, ඔබ පදිංචි ස්ථානයට ආසන්නව සත්කාර ලබා ගත හැක.

PALLIATIVE CARE SERVICES